# 8 ශ්‍රේණිය සිංහල

## 1 ඒකකය

## එතනගාමි



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

පසුගිය සතියේ online පංතිය සඳහා සහභාගී වීමට නොහැකි වුනු සිසුන් සඳහා සහභාගී වූ සිසුන්ගේ උපකරයෙන් ලබා දුන් උපකාරක සටහනකි.

# 01 එතනගොම

Rayumi

## හැඳින්වීම

* ජන කතාව හා ජන කවිය යනු ලියා තැබීමකින් තොරව පරම්පරාවෙන් පරම්පරාවට ගෙන එමින් ජනයා අතර ප්‍රචලිත වූ සාහිත්‍ය නිර්මාණයකි.

* ජන කතාවකට සවන් දී රස විඳීමට හා සාම්ප්‍රදායික දෙවුම් පිළිබඳ අවබෝධයක් ලැබීමට මේ පාඩම උපකාරී වේ.

## අවබෝධය

1. කටගායා, මිරිස් ලාබ් කන්න බැහැ

2. දෙමට දිගේ දී.

3. ගොඩි ගොටියේ වතුර ඇලෙවත් තිබුණා නිසා

4. භාවරිය ගෙනා

5. කාලින් ළමයේ රෑ අල හොරා ගෙන ගිහින් තිබුණා නිසා ඒ ගෙනා ඇත්තා අතා කෑයි සිහිමෙන්

## ලිඛිත අභ්‍යාසය

1) i. එතනාහාමි විසින් සිංගිරාල මෙලවට තිරුණ්-දී සිංගිරාල සතු වූ අවස්ථාවේ.

ii. එතනාහාමි විසින් සිංගිරාල පොළී හැට්ටියේ එල්ලා අරලාවත් තැනේ වළ වූ අවස්ථාවේ.

iii. එතනාහාමි විසින් සිංගිරාල නැතිවූ භාර්යය ගෙනා සාස්තරයක් බැලීමට ගිය අවස්ථාවේ

iv. සිංගිරාල විසින් එතනාහාමිට සාස්තරය වැරදුණු අවස්ථාවේ.

v) එතනහාමි විසින් මැණිකාගේ සිංගිරාලට
සිංගිරාල මැණික්කාගේ හාල් ගෝණු විතර
සමග එත් නැ අවස්ථාවේ.

vi) සාස්තරකාරයා විසින් එතනහාමිට
හැකි වූ පාවරිය ගැන සාස්තරයක්
කීමට ගිය අවස්ථාවේ.



ඩ) පහත සඳහන් ප්‍රස්තාව පිරුළ අදාළ කර ගත හැකි වන ලෙස කතාන්දර නිර්මාණය කරන්න

i. ගහට ඉනි කැපුවා වගේ

එකමත් එක ගමක සරු මුදලාලි කෙනෙක් සිටියේය. ඔහුට ගමේ කඩ එකක් තිබ්බේය. ඔහු ඉතා ධනවත්ය නමුත් ඉතාම ලෝභය. කොහොම ඉතා ධනවත් බව නිසාම මුදලාලි. ඔහුගේ බිරිඳ, සහ පුතා අහංකාර සහ ගමේ මිනිසුන් සමග මැඩි ඇයි හොඳයියක් තිබුණේ නැ. මේ මුදලාලිගේ පුතා සසල් යන සිසුවෙකි. මුදලාලි සහ බිරිඳ එක් දිනක් කතා වුනා "අපේ පුතා ගමේ සාමාන්‍ය මිනිසුන්ගේ දරුවෝ වගේ තියලා නම් හරි යන් නැ, අපි පුතාව ගමේ හොඳම අචාර්ය කොළේ-යාට භාර දෙමු. හොඳින් පුතාව උගන්වන්න තියුණු" බිරිඳ කීවේය. "ඔව් ඔව් මුදල් දෙනකොට හොඳට උගන්වයිනේ." මුදලාලි කීවේය. ඊළඟ දවසේ උදෙන්ම

මුදලාලිත් , බිරිඳත් , පුතාත් ආචාර්යයා
ළඟට පිටත්ව ගියේ ය. මුදලාලිත්, බිරිඳ
-ත් ආචාර්යවරයා සමඟ කතා කිරීමත්
සමඟ ආචාර්යවරයා දරුවාට ඉගෙනීම
සඳහා කැමති විය. මුදලාලි ආචාර්යවරයාට
සහ අවශ්‍ය කරන දේ සඳහා විශාල
වියදමක් වැය කරති. මුදලාලි සහ බිරිඳ
තම දරුවා අනෙක් දරුවන්ට වඩා ~~[illegible]~~
ඉහළින් විභාග සමත් වෙයි කියා බොහෝ
-හෝ සතුටින් සිටියේ ය. මුදලාලි බිරිඳ
මුළු ගම පුරාම ගොස් පාසල් තිබෙන
විභාගයෙන් මගේ දරුවා ඉහළින්ම සමත්
වෙනවා යැයි පැවසුවේ ය. කාලය ගත
වුණේ ය , විභාගය පැවැත්වෙන දිනය
පැමිණියේ ය. මුදලාලිත් , බිරිඳත් දරුවා
විභාගයට ගෙන ගියෝ ය. ඒ කාලය ගෙවී
යාමත් සමඟ ප්‍රතිඵල ලැබුණේ ය. මුදලාලි
-ත් බිරිඳත් ප්‍රතිඵල බලා දුක් මුසු මුහුණින්
පැමිණියෝ ය. දරුවා විභාගය අසමත් වී
ඇත. "අපි මේ ළමයාට වියදම් කරපුවා
හරියට ගඟට ඉනි කැපුවා වගේ" මුදලා
-ලි බිරිඳ පැවසුවේ ය.

3. පහත සඳහන් විස්තර ඇසුරින් කතා නිර්මාණය කරන්න.

(අ) එකමත් එක ගමක සරුසාර හේනක් තිබුණා. ගමරාළත් සහ ගම හාමිනේ හේනට යති. වට්ටක්කා වැලෙහි විශාල ගෙඩියකි. ගමරාල මෙය දුටුවේය. ගම හාමිනේටත් ගමරාල මෙය පෙන්නුවේය. වට්ටක්කා ගෙඩිය ගෙදර ගෙනැවිත් ඔවුහු එය දෙකට කපති. වට්ටක්කා ගෙඩිය තුළින් දිලිසෙන මැණිකක් මතු වෙයි. ගමරාලත් ගම හාමිනේත් තිගැස්සුණේය. ඔවුන් විස්මයට පත් විය. මැණික් ගල ගමරාල විසින් අතට ගත්තේය. මැණික් ගල අතට ගත් සැණින් මතු වූ රුවකි. ගමරාලත් ගම හාමිනේටත් අදහා ගැනීමට බැරි විය. මතු වූ රුව මෙසේ පැවසුවේය. "මාගෙන් කැමති වරයක් ඉල්ලනු මැනවි. මා එය ලබා දෙන්නම්" ගමරාල හා ගම හාමිනේ බොහෝ සතුටට පත්විය. ගමරාල වරමක් ඉල්ලුවේය. වරම ලැබුණේය. නමුත් පැමිණීම

එක කාලෙකි සැයි මතු වූ රූප සලසුවේ ය. බොහෝ සතුටට පත් වූ ගැමරාලන්. ගෙමහාමිණෝන් එය ඇසා කාතාගොවු වුවේ ය.

(ආ) එක් කාලෙක ගුහාවක සිංහයෙකි. ඒ අසල මීයෙක් කාරණානම් අල්ලයි. ගුහාව සමීපයේ නරියෙක් ද සැඟවී සිටියි. ඉතාම අලස සිංහයා නින්දන ලැටෙයි. සිංහයා තද්නම නිදි බව මීයාට ~~පැ~~ පෙනුණේ ය. මීයා සෙමින් සෙමින් සිංහයා අසලට පැමිණෙයි. මීයා සිංහයාගේ හිස දෙසට වැවී ඇති ලෝම කාපයි. මෙය දුටු නරියා මෙසේ සිතයි "සිංහයා නම් හොඳට නිදියි අද කෑමකුත් නැතේ මීයව අල්ල ගන්න නම් හරි". ~~ඊර්ෂා~~ කාපටි නරියා සිංහ වෙස් ගනී. නරියා සිංහ ගුහාවට පිවිසෙයි. සිංහයා, මීයා, නරියා ඇරු සිංහ ගුහාව දෙසට විශාල නාගයෙක් ඇදී එයි. සිංහ වෙස් ගත් කාපටි නරියා නාගයා දැක බියි වී කෑ ගසයි.

කෑ ගසමින් නරියා හිස හාරවු අත දිවුවේ ය. ඒ හඬින් සිංහයා අවදි විය. සිංහයා අවදි වූ නිසා මීයා ද වේගයෙන් දිව්වේ ය. නාගයා ද වේගයෙන් පිටව ගියේ ය.

# සාම්ප්‍රදායික යෙදුම්

(i) ප්‍රස්තාව පිරුළු - ප්‍රස්තාව හෙවත් අවස්ථාව-නට ගැළපෙන කියමන ප්‍රස්තාව පිරුළකි.

*මේවා නානාවිධ ආකාරයෙන් නිර්මාණය වී ඇති අතර ගැඹුරු අර්ථයක් සරලව ඉදිරිප-ත් කිරීම, උපදේශය, උපහාසය, හාස්‍යය යන ගුණාංග දැකිය හැක

උදා :-

- මන්නාගේ ඉඹුල් ගහගෙනා වගේ
- හොරට ඉනි කැපුවා වගේ
- කාළුමා මාරපන් ගියා වගේ

(ii) ගූඪ වැකි / රැකි - වචනවලින් කියැවෙන අර්ථයක් ඇති යෙදුම් ගූඪ වැකි ලෙස හැඳින්වේ.

උදා :- කුසේ මලක් පිපුනා

ඇඟිලි ගනිමින් සිටියා

පොරකාපු ගොවිලා

* **යුගල පද** - පද යුගලක් එකට යෙදෙමින් එකී අර්ථ එකක් දෙන පදයුගල 'යුගල පද' ලෙස හඳුන්වයි.

උදා :- හරකා බානා

ගොඩ වැඩ

සීතා මතා

**ලිඛිත අභ්‍යාසය**

1 (1) - සතුටින් හා අපේක්ෂාවෙන් සිටිය

(2) - නොරිදී අවබෝධයකින් සිටීම.

(3) - බොරු කියමින් මවා පෑම

(4) - අවසාන උත්සාහයක් ගැනීම.

(5) - බලය පිරිහී

(6) - සිල්ප වෙලාවක තිබ්ද

(7) - නිශ්චල ක්‍රියාවක යෙදීම

(8) - දුර්වලයාගේ අධිකාරත්වම

(9) - බොරු සිලයක් පෙන්වීම

(10) - මිතුට එක කිරීම.

3 i) සුව - පහසුව

මිල - මුදල් ලේ

යාන - වාහන

මිතු - පිට

කෑම - බීම

උයි - උයන්පත්

(ii) ලාභ - පාඩු

උගත් - නූගත්

හොඳ - නරක

ඉදු - මැඩී

අග - මුල

බාල - මහලු

(iii) අනං - මනං

ලප්ට - ලොප්ට

උඩිං - හිඩිං

වං - හුං

තාත්තා - මුත්තා

ලවක් - දෙවක්

දමයි - බමයි.

ඉඩම් - තාඩම්

උළප් ඇළප් .

බඩ මුටු .

තාටා ගෝයා ඕදා මඩා

ඇලී ගෙලී කර කියා .

ලියා කියා

4) i. ඇදහිලි

ii. ඇදහිලි විශ්වාස

iii. ළමයි බමයි

~~iv. කුඹු~~

v. රළුම් ගොරළුම්

vi. නාඩන ගීඩන

vii. ඇඹුම කුඹුම

viii. සද්ද වද්ද

ix. නාකින මාකින

x. ඇඩා දොඩා

6) i. දැකීමට කොහොමත්ම අකමැති වීම.

ii. සතුටින් බව පෙන්වමින් ~~සිටින~~ පිරිසක් අසතුටින් ක්‍රියා කරයි.

iii. මීනා මාසය කාල ද මාසියේ දී වෙනස් වීම.

NALANDA VIDYALAYA NALANDA VIDYALAYA
NALANDA VIDYALAYA NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

**8 ශ්‍රේණිය** | **සිංහල භාෂාව** | **ඒකකය: 1 - එතනහාමි**

1) **පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවල අදහස ලියන්න.**

(1) ගලේ කෙටූ අකුර වගේ
(2) හොරාගේ අම්මාගෙන් පේන ඇහුවා වගේ
(3) උරුලෑවා ගිය පාර වගේ
(4) ආරේ ගුණ නෑරේ
(5) ඉබ්බා කට හින්දා නැහුණා වගේ
(6) අගේ ඉඳන් කන කනවා වගේ
(7) අබරා සිල්ගත්තා වගේ
(8) පාළු ගෙයි වළං බිඳිනවා වගේ
(9) කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වාගේ
(10) යුද්දෙට නැති කඩුව කොස් කොටන්න ද?
(11) තැනේ හැටියට ඇණේ.
(12) දේසේ හැටියට බාසේ
(13) සුබ නම් දොරටුපාලකයා ඔටුනු පැලැන්දුවා වගේ.
(14) අල්ලපු අත්තත් නෑ පය ගහපු අත්තත් නෑ.
(15) බල්ලෙක් බිරුවාට කන්දක් මිටි වේ ද?
(16) අනේ කාලේ වනේ වාසේ.
(17) කළ කළ දේ පල පල දේ
(18) ජාඩියට මූඩිය වගේ
(19) කොරේ පිටට මරේ

2) පහත සඳහන් ප්‍රකාශ කා විසින් කා හට කුමන අවස්ථාවක දී කියන ලද ද?

i) ''ඇයි ඔය මඩක්කුවෙ උඹල තියාපු හොදිවලින් ගත්තෙ''
ii) ''ඔන්න සාස්තරේ හරියට කියවීගෙන එනවා නේද?''
iii) ''උඹේ මේ කෙහෙම්මල් හවරිය හින්දා මගේ හේනේ කුඹුරේ වැඩත් පාළු වුණා.''
iv) ''ඔහේ මොකද කියන්නේ ..... අපි දෙන්න යමුද සාස්තරයක්වත් අහන්න.''
v) ''මේ ඇත්තටම බත් කෑවේ මොනව එක්කද?''
vi) ''මේ ඇවිල්ල ඉන්නෙ නැතිවුණ දෙයක් ගැන අහන්නයි''

3) පහත සඳහන් ප්‍රස්තාව පිරුළු අදාළ කර හැකි ලෙස කතන්දර නිර්මාණය කරන්න.

i) අබරා සිල් ගත්තා වගේ
ii) ඉබ්බා කට හින්දා නැහුණා වගේ

Answered by
Rayumi

නාලන්දා විද්‍යාලය - කොළඹ 10
ඒකක පරීක්ෂණ
සිංහල භාෂාව

1. විකානගෝමි.

1) (1) ස්ථිරවම කිව හැකි ය.

(2) ඇත්ත සඟවා බොරු කීම.

(3) අසත්පුරුෂයන්ගේ වැඩ අප්‍රසන්නතා බව

(4) උත්පත්තියෙන් ලැබූ පුරුදු වෙනස් කළ නොහැකි බව.

(5) සුදුසු නුසුදුසු දේ පිළිබඳ නොතකා යමක් කිරීමෙන් විපාක විඳීම.

(6) ළඟින් ඇසුරු කරමින් හොරකම් කිරීම.

(7) කරන්නන් වාලේ දෙයක් කිරීමට ගොස් අමාරුවේ වැටීම.

(8) අවශ්‍ය පුද්ගලයා නැති විටෙක දී ශ්‍රේෂ්ඨ භාර කළ කෙනා හැකිම හෝ කියැවූ දෙයක් කිරීම.

(9) නුසුදුසු පුද්ගලයින්ට තනතුරු දීම

(10) උවමනා වේලාවට නැති දෙයින් ඇසුව වලක් නොවීම

(11) තැනට නුසුදුසු ආකාරයට ක්‍රියා කිරීම.

(12) තැනට නුසුදුසු ලෙස වැඩ කටයුතු කිරීම.

(13) අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම.

(14) සිටින තරමට වඩා ඉහළ තත්වයක් ලබා ගැනීමට ගොස් අවස්ථා දෙකම අහිමි වීම

(15) යම් කෙනෙක් කොළමතු ~~දැනගෙන~~ ~~සිටිය~~ උන් සහ කාලේ ඒ දෙය වෙනස් කිරීමට නොහැකි වීම

(16) කිසිදු පිළිසරණක් නැතිවූ විට ඉබාගාතේ යමින් ජීවත් වීමට සිදු වේ.

(17) කරන සියලු ක්‍රියාවන්ට ප්‍රතිඵලයක් ලැබේ.

(18) දෙහොඳින් ගැළපෙන.

(19) කාරදරයක් කාරදරයක් පසු වීම.

2) i) ඩිංගිරාල විසින් එතනහාමිට ඩිංගිරාල මඩකන්ඩාවේ ගොඩ සමඟ බත් කෑ අවස්ථාවේ.

ii) එතනහාමි විසින් ඩිංගිරාල නැති වූ භාවරිය ගැන සාස්තරයක් බැලීමට ගිය ~~වෙලාවේ~~ අවස්ථාවේ.

iii) ඩිංගිරාල විසින් එතනහාමිට සාස්තරය මැරලුනු අවස්ථාවේ


iv) එතනහාමි විසින් ඩිංගිරාලට ~~විසින්~~ එතනහාමිගේ භාවරිය නැති වූ විට ඒ ගැන දැන ගැනීමට සාස්තරයක් බැලීමට යමු කියා කිවූ අවස්ථාවේ.

# ප්‍රස්ථා පිරුළු




රයුමි සෙනුරිකා පතිරණ

# ගමරාල දෙව්ලොව ගියා වගේ



යමක් ගැන කරන වැඩි වර්ණනාව ඒ ව්‍යාපාරය කඩාකප්පල් වීමට හේතු වන බව දැක්වෙන්නකි. දෙව් ලොවින් එන අලියෙක් ගමරාළ කොහෙනුගේ කුඹුරේ ගොයම් කන සිරිතක් පැවතිනි. කුඹුරේ විශාල අඩි වගයක් දුටු ගමරාළ සැඟවී බලා සිටිද්දීම ගොයම් කා දෙව්ලොවට යන්නට අහසට නගින අලියා දකින්නට ලැබුණා. තමාත් අඹුදරුවන් සමග දෙව්ලොවට යාමට කැමැති කොට ගමරාළ සපිරිවරින් කුඹුරට ළඟා විය. අලියා ගොයම් කා අහසට නගින්නට සැරසෙත්ම ගමරාළ උගේ වලිගයේ එල්ලුණේය. ගම මාසියා ගමරාළගේ ඇඟේ එල්ලුණේය. ගම මාසියාගේ ඇඟේ වැඩිමල් දියණිය එල්ලුණේය. මෙසේ ගම පවුලේ උදවිය අලි වලිගයේ එල්ලී දෙව්ලොව දෙසට නගිත්ම දිව්‍ය ලෝකයේ වූ මනිනා තුරණිය කොච්චර විතර ඇද්දැයි ගම මාසියා ප්‍රශ්නයක් නැගුවාය. "මෙච්චර විතර ඇතැයි දක්වීම පිණිස ගමරාළ අත් එදුහා" දක්වත්ම වලිගය අත හැරුණු හෙයින් ගම පවුලම බිම වැටී විනාශයට පත් විය.

# අරගෙස් මල්ලිගා සිතුවම වගෙයි



සමන්ත් තමන්ට මුදල් ලැබුණම මොනවා ද කරනවා. මෙහෙම ගෙවල් දොරවල් හදා වාහන ගන්නවා. ගොනා ද වගාවන් ද සිතා දුක හිතී. මනෝරාජ්‍යයේ තියන්නේ මොලයට මේ සම්බන්ධයෙන් ජන කතාවක් ද ඇත. දිනක් සමන්ත ගොවි කාර්යයෙන් හොඳ ප්‍රතිඵල දිනා ඒ කල්පනා කරමින් උන්නේය. ඔහුගේ ගෙවත්ත දෙපස ගෙඩි පදින් තර වූ අඹ ගස් දෙක මේ මොහොතේදී ඔහුට පෙනුනා. මෙම ගස් දෙකම ගෙඩි වලින් බරවී ඇත. මම ජිනාගේ වෙන එක අඹ ගසකවත් ගෙඩි නැත. අඹ අඹ මල ද නැති ඇත. මෙලා අඹ වලින් මට රුපියල් සිය ගානක් ලැබේ. අඹ විකුණා ලැබෙන මුදලින් මම එළි දෙනුන් කන් අට දෙනෙකු මිලට ගන්නෙමි. ඔවුන් ඊළඟට වසී විසි කිරි ගාරනක් ලබනවා ඇත. එම කිරි විකිණීමෙන් මට මසකට රුපියල් සිය ගණනක් ලැබේවි. පැටි කල් නොගොස්ම නව නවන් පැටවුන් ලැබීමෙන් මුදලින් සිය ගණනක් ලැබේවි.

# කාවිච්චා මාරපන් ගියා වගේ



මෙය සුලභ ප්‍රසිද්ධ පිරුළකි. රත්නපුර කුරුවිට ගමේ එක් ප්‍රභූ පවුලක ස්වාමියාට කාවිච්චා නමැති සේවකයෙක් සිටියේ ය. මොහු මෝඩ මනුෂ්‍යයෙක් ඔහුගේ ස්වාමියා දවසක් මේ කාවිච්චා අමතා ඔහුගේ සිරිලගේ ගම වන මාරපනට පණිවිඩයක් යවන්න තියෙන බැවින් කාවිච්චෝ නුඹ අද මාරපන ගිහින් එන්න ඕනෑ යැයි පවසා ස්වාමියා තමාගේ වැඩ පල වල නියැලුනාය. ඉතින් නංගි, මල්ලි කාවිච්චා ගේ දොර හෝ කුඹුරේ වැඩක නියැළී ඇතැයි සිතා කාවිච්චාගේ ස්වාමියා දවල් නෑම වේල එනතුරු බලාපොරොත්තුවෙන් සිටියා. නමුත් කාවිච්චා පේන තෙක් මානයේ නැහැ. සවස් වරුවේ අඳුරින් කාවිච්චා එනවා දැකලා "කොහේද උඹ ගියේ මම හැම තැනක සෙව්වා" "මම මාරපන ගියා" උඹ හරි මිනිසෙකිනෙ! පනිවිඩේ අහගත්තේ නැතිව ගිහින් මොනවද කීවේ. අද මාරපනේ ගිහින් එන්න ඕනෑයි කීව නිසා මම ගිහින් ආවා. මෙබඳු සිද්ධීන් හෝ කතාවක් පසු බිම් කර ගනී ප්‍රසිද්ධව. පිරුළු රාශියක් සිංහල ව්‍යවහාරයේ දක්නට ලැබේ.

# රූඪී හෙවත් ඉගි වැකි

**නිර්වචනය :-** "මතුපිට අර්ථය ඉක්මවා වෙනත් අර්ථයක් අගවන වැකි **රූඪී හෙවත් ඉගි වැකි** නම් වේ."

- පොත් ගුල්ලා - පොත් පත් කියවීමට ඉතා කැමැත්තක් දක්වන්නා
- දෙහි කපනවා - බනිනවා
- ගඟට ඉනි කපනවා - තේරුමක් නැති වැඩ කිරීම
- කරල පැහිලා - කිසි අගහිඟයක් නැති, අතමිට සරු
- උඩින් පල්ලෙන් - කිසිම සැලකිල්ලක් නැතිව
- නරි අං සෙවීම - සොයන්නට අපහසු දෙයක් සොයා වෙහෙසීම
- හණමිටි කාරයා - පැරණි මත දරන්නා
- හෙම්බත් වුණා - ඉතා වෙහෙසට පත්වීම
- කණ කොකා හැඬීම - කරදරවලින් පිරුණු කාලයක් උදා වීම.
- මඩේ සිටවූ ඉන්න - ස්ථිර අදහසක සිටීමට නොහැකි
- දිවෙන් දිව ගාගෙන - ඉතා මිතුරු බවින්
- තිත්ත වීම - එපා වීම
- හිණිපෙත්තට ම - ඉහළට ම
- පදයක් හදනවා - අපහාසයට පත් කරන්න බොරු කතා සෑදීම
- නයි පොළොන් වෛරය - ඉතා සතුරු
- බක තපස් රැකීම - අනුන්ට පේන්න සිල්වත් වීම
- ගොම්මන් වේලාව - අඳුර වැටීගෙන එන වේලාව
- හඳ ඉල්ලා හැඬීම - නොලැබෙන දෙයක් වෙනුවෙන් වෙහෙසීම
- අඹ යාළුවා - හොඳම මිතුරා
- කඩිගුලක් වගේ - ඉතා කඩිසරව
- කොළේ වහලා ගහනවා - ඇත්ත වසන් කිරීම
- 
- කජු කන්නා වගේ - ඉතා පහසු
- ගිනිබත් වුණා - විනාශ වුණා
- කළුකඩකාරයා - අයුතු ලාභ ලබන්නා
- හුඹස් බිය - පුහු බිය
- ගල් පැලෙන බොරු - පිළිගැනීමට අපහසු පුවත්
- මොර සූරන වැස්ස - ඉතා තදින් වහින වැස්ස
- රජ ගෙදර පරවියා - සැප සම්පත් විඳින්නා
- සිකුරට ම - ස්ථිර ලෙස ම
- බහින කලාව - පිරිහෙන කාලය
- මූණේ දැලි ගෑවා - නින්දාවට පත් කිරීම
- ගොළුබෙලි ගමන - ඉතා හෙමිහිට යන ගමන
- කිඹුල් කඳුළු හෙළීම - බොරුවට හඬනවා
- ආ පයින් යනවා - ආ ගමන් ම ආපසු යෑම

- අවලංගු කාසියක් සේ - කිසි ම වටිනාකමක් නැති
- අස්සක් මුල්ලක් නෑර - සෑම තැනක ම
- කිරි ගහට ඇන්නා වගේ- නිවැරදිව ම, ස්ථිර ලෙස ම
- ඇඟේ මාළු නටනවා - දැඩි කෝපයට පත් වීම
- හවුහරණක් නැති - කිසි ම පිහිටක් නැති
- ඔළුව ඉදිමිලා - උඩඟුවීම
- ගැටයට හසු වෙනවා - උපායට හසු වෙනවා
- අකරතැබ්බය - කරදරය
- අනූනවයෙන් බේරුණා - ඉතා අසීරුවෙන් ගැලවීම
- සෙනසුරු ලබනවා - ඉතා අපහසු කාලයක් උදා වෙනවා
- බේගල් අත අරිනවා - බොරු කියනවා
- සිහින මාලිගා තනනවා - නොවන දේ ගැන සිතනවා
- එලොව පොල් පෙනුණා - හදිසි කරදරයකට පත් වෙනවා
- ඊ ගහක වේගයෙන් - ඉතා වේගයෙන්
- අත හිත දෙනවා - උදව් කරනවා
- ඇඹලයා - යමකට ඇලී ගැලී සිටින
- රුස්සන්නෙ නෑ - අකමැති
- ස්කුරට ම - නිසැකව ම
- ආවාට ගියාට - නොසැලකිලිමත්ව
- කුකුළා අතින් ගෙන - උදේ රැයින් ම
- අර අඳිනවා - සූදානම් වෙනවා
- තොරතෝංචියක් නැතිව - නොකඩවා
- අන්දුන් කුන්දුන් වුණා - පුදුම වුණා
- වග තුග සොයනවා - අඩුපාඩු සොයනවා
- ඇඟිලි ගනිමින් ඉන්නවා - නොඉවසිල්ලෙන්
- හරි බරි ගැහෙනවා - ලෑස්ති වෙනවා
- දිව ගිලෙන්න ගියා - අධික පිපාසයෙන් සිටීම
- දිනන පිලට හෝයියා කීම - දිනන පැත්තට එකතු වීම
- පැදුරට නාකි වෙනවා - නිකරුනේ වයසට යෑම
- ලුණු නැති හොද්ද වගේ- යමක් අසම්පූර්ණ වීම
- අලියා වගේ - ඉතා මහත (ස්ථූල)
- හොර ගල් අහුලනවා - අවස්ථාව ලැබෙන තුරු මග බලා සිටීම
- නහින දෙහින කාලෙ - ජීවිතේ අවසන් කාලෙ
- යටි මඩි ගහනවා - මුදල් වංචා කිරීම
- පිං ගොනා - කිසිම වැඩක් නොකර සිටින්නා
- කිරි ඉතිරිලා - ඉතා සාරවත්
- පාළු පැල් රැකීම - නිශ්ඵල දේ කිරීම
- ඉර හඳ වගේ - ස්ථිරයි
- කන් කෙඳිරි ගානවා - යමක් කරන්නට අදි මදි කරනවා
- ජූලි හතයි - මහා විපතක්
- ඉස්පිල්ලක් පාපිල්ලක් නෑර - කිසිවක් අත් නොහැර
- වැට උඩ සිටීම - එක තීරණයකට එළඹ නොගෙන සිටීම
- කඩිමුඩියේ - කලබලයෙන්
- කන්දොස්කිරියාව - හිරිහැරය

# රුඩි

කජු කන්නා වගේ - ඉතා පහසු
ගිනිබත් වුණා - විනාශ වුණා
කළුකඩකාරයා - අයුතු ලාභ ලබන්නා
හූඔස් බිය - පූහු බිය
ගල් පැලෙන බොරු - පිළිගැනීමට අපහසු පුවත්
මොර සූරන වැස්ස - ඉතා තදින් වහින වැස්ස
රජ ගෙදර පරවියා - සැප සම්පත් විඳින්නා
සිකුරට ම - ස්ථිර ලෙස ම
බහින කලාව - පිරිහෙන කාලය
මූණෙ දැලි ගෑවා - නින්දාවට පත් කිරීම
ගොළුබෙලි ගමන - ඉතා හෙමිහිට යන ගමන
කිඹුල් කඳුළු හෙළීම - බොරුවට හක්ෂනවා
ආ පයින් යනවා - ආ ගමන් ම ආපසු යෑම
ළිඳේ ඉන්න ගෙම්බා - බාහිර ලෝකය ගැන කිසිවක් නොදන්නා
රුසියා - දක්ෂයා
ඉහේ මලක් පිපුණා - ඉතා සතුටට පත් වීම
අවලංගු කාසියක් සේ - කිසි ම වටිනාකමක් නැති
අස්සක් මුල්ලක් නෑර - සෑම තැනක ම
කිරි ගහට ඇන්නා වගේ- නිවැරදිව ම, ස්ථිර ලෙස ම
ඇහේ මාළු නටනවා - දැඩි කෝපයට පත් වීම
හවුහරණක් නැති - කිසි ම පිහිටක් නැති
ඔළුව ඉදිමිලා - උඩඟුවීම
ගැටයට හසු වෙනවා - උපායට හසු වෙනවා
අකරතැබ්බය - කරදරය
අනූනවයෙන් බේරුණා - ඉතා අසීරුවෙන් ගැලවීම
සෙනසුරු ලබනවා - ඉතා අපහසු කාලයක් උදා වෙනවා
බේගල් අත අරිනවා - බොරු කියනවා
සිහින මාලිගා තනනවා - නොවන දේ ගැන සිතනවා
එලොව පොල් පෙනුණා - හදිසි කරදරයකට පත් වෙනවා
ඊ ගහක වේගයෙන් - ඉතා වේගයෙන්
පොත් ගුල්ලා - පොත් පත් කියවීමට ඉතා කැමැත්තක් දක්වන්නා
දෙහි කපනවා - බනිනවා
ගහට ඉනි කපනවා - තේරුමක් නැති වැඩ කිරීම
කරල පැහිලා - කිසි අගහිඟයක් නැති, අතමිට සරු
උඩින් පල්ලෙන් - කිසිම සැලකිල්ලක් නැතිව
නරි අං සෙවීම - සොයන්නට අපහසු දෙයක් සොයා වෙහෙසීම
හණමිටි කාරයා - පැරණි මත දරන්නා
හෙම්බත් වුණා - ඉතා වෙහෙසට පත්වීම
කණ කොකා හැඬීම - කරදරවලින් පිරුණු කාලයක් උදා වීම.
මඩේ සිටවූ ඉන්න - ස්ථිර අදහසක සිටීමට නොහැකි
දිවෙන් දිව ගාගෙන - ඉතා මිතුරු බවින්

තිත්ත වීම - එපා වීම
හිණිපෙත්තට ම - ඉහළට ම
පදයක් හදනවා - අපහාසයට පත් කරන්න බොරු කතා සෑදීම
නයි පොළොන් වෛරය - ඉතා සතුරු
බක තපස් රැකීම - අනුන්ට පේන්න සිල්වත් වීම
ගොම්මන් වේලාව - අඳුර වැටීගෙන එන වේලාව
හඳ ඉල්ලා හැඬීම - නොලැබෙන දෙයක් වෙනුවෙන් වෙහෙසීම
අඹ යාළුවා - හොඳම මිතුරා
කඩිගුලක් වගේ - ඉතා කඩිසරව
කොළේ වහලා ගහනවා - ඇත්ත වසන් කිරීම
අත හිත දෙනවා - උදව් කරනවා
ඇඹලයා - යමකට ඇලී ගැලී සිටින
රුස්සන්නෙ නෑ - අකමැති
නහින දෙහින කාලෙ - ජීවිතේ අවසන් කාලෙ
යටි මඩි ගහනවා - මුදල් වංචා කිරීම
පිං ගොනා - කිසිම වැඩක් නොකර සිටින්නා
කිරි ඉතිරිලා - ඉතා සාරවත්
පාළු පැල් රැකීම - නිශ්ඵල දේ කිරීම
ඉර හඳ වගේ - ස්ථිරයි
කන් කෙඳිරි ගානවා - යමක් කරන්නට අදි මදි කරනවා
ජූලි හතයි - මහා විපතක්
ඉස්පිල්ලක් පාපිල්ලක් නැර - කිසිවක් අත් නොහැර
වැට උඩ සිටීම - එක තීරණයකට එළඹ නොගෙන සිටීම
කඩිමුඩියේ - කලබලයෙන්
කන්දොස්කිරියාව - හිරිහැරය
සිකුරට ම - නිසැකව ම
ආවාට ගියාට - නොසැලකිලිමත්ව
කුකුළා අතින් ගෙන - උදේ රැයින් ම
අර අඳිනවා - සූදානම් වෙනවා
තොරතෝංචියක් නැතිව - නොකඩවා
අන්දුන් කුන්දුන් වුණා - පුදුම වුණා
වග තුග සොයනවා - අඩුපාඩු සොයනවා
ඇඟිලි ගනිමින් ඉන්නවා - නොඉවසිල්ලෙන්
හරි බරි ගැහෙනවා - ලෑස්ති වෙනවා
දිව ගිලෙන්න ගියා - අධික පිපාසයෙන් සිටීම
දිනන පිලට හෝයියා කීම - දිනන පැත්තට එකතු වීම
පෑදුරට නාකි වෙනවා - නිකරුනේ වයසට යෑම
ලුණු නැති හොද්ද වගේ- යමක් අසම්පූර්ණ වීම
අලියා වගේ - ඉතා මහත (ස්ථූල)
හොර ගල් අහුලනවා - අවස්ථාව ලැබෙන තුරු මග බලා සිටීම

# ප්‍රස්ථාව පිරුළු  සිංහල භාෂාව

## අ

1. **"අනුනවයෙන් බේරුණා"-** කිසියම් විපතක දී එම විපතට ආසන්නව සිට ගැලවීමේදී කියනු ඇසේ. මේයම "අනුනවයි දශම නමයෙන් (දශම ගණනින්) බේරුණා" කියාද වත්මන් සමාජයේ අය මදක් වෙනස් කර ඇත. "කෙස් ගහෙන් බේරුණා","දෙයියෝ බේරුවා" යන කියමන්වලින් ද ඉහල පිරුළේ අරථයම කියැවේ.
2. **''අනුන්ට කල දේ තමන්ට පලදේ'' -** අනුන් වෙනුවෙන් කල නරක ක්‍රියාවක ප්‍රතිඵල තමන් වෙත ද ලැබිය හැක
3. **"අටුව කඩා පුටුව සෑදුවා වාගේ'' -** අතිතයේ ගම්බද ගෙවල් වල ධාන්‍ය වර්ග තැන්පත් කර ඇත්තේ කුස්සියේ ළිපට උඩින් ඇති සොල්දර තට්ටුවකය. කුස්සියේ බාල්කයට හතරැස් ලී හෝ ලෑලිදමා මෙය තනා ඇත. මේවැනි අටුවක් කඩා දමා එම ලී වලින් එක් අයෙකුට වාඩි වීමට පුටුවක් තැනීම මුල්කරගෙන වූ කතාවකින් මේ පිරුළ ගොඩ නැගී ඇත. සුළු ප්‍රයෝජනයකට විශාල පාඩුවක් කර ගැනීම අනුවන කමක් මෙයින් ප්‍රකාශ වේ.
4. **"අලි මදිවාට හරක්" -** විශාල කරදරයක්, විපතක් ඇති අවස්තාවක තවත් අතුරු කරදර පැමිණීම.
5. **"අනුන්ගේ පානින් එලිය බැලීම" -** කිසිවෙකුගේ මුවාවෙන් තමන් ප්‍රයෝජනය ගැනීමක් මෙයින් අදහස් කෙරේ. වෙනත් අයගේ කටයුතුවලට මැදිහත් වී ඒ මගින් ප්‍රයොජනයට ගන්නා පුද්ගලයන් අප අතර සිටි. ඔවුන් බොහො විට උස්සහ කරන්නේ වෙනත් අයගේ මහන්සියෙන්, වියදමින් කපටි ලෙස හොදනම ලබා ගැනීමයි.
6. **"අඩුව තිබෙද්දි අත පුච්චා ගැනීම" -** කිසියම් කටයුත්තක් කිරීමේදි එය කළ යුතු නියම ක්‍රමයක් තිබේ. නියම ක්‍රමයෙන් නොහොත් හරි මාර්ගයෙන් කටයුතු නොකර වෙනත් ආකාරයකින් කටයුතු කිරීමට යාම නිසා සිදුවන වැරදීමේ දී මේ ප්‍රස්ථාව පිරුළෙන් කියති.
7. **''අතීසාරෙට අමුඩේ ගැහුවා වගේ''** - අතීසාරය යනු පමණ ඉක්මවා බඩඑළිය යාමේ රෝගයකි එයට ප්‍රතිකාර කිරීම වෙනුවට අමුඩය ගසා තද කර ගැනීම අනුවන ක්‍රියාවකි.
8. **''අබරා (අබරං,ගමරාළ) සිල් ගත්තා වාගේ'' -** තමාට නුපුරුදු දෙවල් කිරීමට ගොස් අමාරුවේ වැටීම.
9. **"අනුන්ගේ මගුල් ගෙදරක දී සැලකීම" -** වෙනත් අයෙකුගේ මගුල් ගෙදරක කෑම මේසයේ දී තම හිත මිතුරන්ට අත දිගහැර සැලකීමක් මුල් කරගෙන මෙය නිර්මාණය වී තිබේ.
10. **"අනුන්ගේ රුපියලය වඩා තමන්ගේ සතය වටී" -** අනුන් සතු ධනය තමන්ට උවමනා පරිදි ප්‍රයෝජනයේ යෙදිය නොහැකිය. හදිස්සියකදී තමාට රිසි පරිද්දෙන් වහා වැඩ ගත හැක්කේ තමා ළග ඇති මුලද පමණි.
11. **''ආඩි හත් දෙනාගේ කැද හැලිය වාගේ'' -** එකිනෙකා රැවටීමට ගොස් තමාම රැවටීම.
12. **''ඇඟිල්ලේ තරමට ඉඳිමෙන්න''**
13. **''අඩන්න ඉන්න මිනිහට ඇඟිල්ලෙන් ඇනින්නා වාගේ''**
14. **''අන්දරේ සීනි කෑවා වාගේ'' -** ඉහළ පෙලේ අයගේ බොරු නිසා ඔවුන්ම අමාරුවේ දැමීමට පහළ පංතියේ අයටක් බොරුවෙන්ම හැකියාවක් ඇති බවයි

15. **''අගේ ඉඳා කන කනවා වාගේ''-** කිසිවෙකුගෙන් යැපෙමින් ඔහු ළග සිට ඔහුටම විපත් සිදු කිරීමට කටයුතු කිරීමක් ගැන මෙයින් කියැවේ.
16. **''අබුද්දස්ස කාලේ ලබුත් තිත්තයිලු''-** අබුද්දස්ස කාලය නම් බුදු කෙනෙකු නැති කාලයයි. පුදුම සහගත දේවල් මේ කාලයේ සිදුවන බව පැරණි බෞද්දයන්ගේ විශ්වාසයයි. ලබු නැමැති එළවළු වර්ගය තිත්ත නැත. එහෙත් ගුණදම් නැති කාලවලදී ලබු පවා තිත්තවීම පුදුමයක් නොවේ.
17. **''අබ කෑ මිනිහගේ මොළේ දනවා වාගේ''-** තමා කළ කී දෑ දන්නේ තමාම පමණි. අබ සැර කුළුබඩු වර්ගයකි එය වැඩිපුර අහාරයට ගැනීමෙන් නාසයේ දැවිල්ල හටගනී. එහෙත් එය කිසිවෙකුට පෙනෙන්නෙත් දැනෙන්නෙත් නැත දැනෙන්නේ තමාට පමණි වරදක් කල තැනැත්තා පසුව ඒ ගැන පසුතැවිලි වේ.
18. **''ඇට් කෙහෙල් කාපු උගුඩුවා වාගේ''**
19. **''අතු කඩා මොර කන්නා වාගේ''**
20. **''ඇතා වැහැරුනත් කොරහේ නාවන්නට බැරුවා වාගේ''**
21. **''අනුන්ගේ පහනින් එළිය බලනවා වාගේ''**
22. **''අන්ධයෝ අලියාගේ හැඩ කිව්වා වාගේ''**
23. **''අත්හැරෙන දීග හෙවනැල්ලත්ඇදයිල**
24. **''අශ්වයා පිට පුහුල් තැබුවා වගේ''**

# ඉ

1. **''ඉවසීමෙන් සැනසීම ලැබේ'' -** ජයග්‍රහණ ලබාගැනීමට නම් ඉවසීමෙන් කටයුතු කල යුතුය.
2. **''ඉක්මන් කොටයි'' -** වැඩි හදිස්සියක් හොඳ නැත
3. **''ඉඟුරු දීලා මිරිස් ගත්තා වාගේ''** _අනවශ්‍ය දෙයක් ඉවත් කර ඊට වඩා අනවශ්‍ය දෙයක් ළංකර ගැනීම
4. ***ඉහේ මලක් පිපුණා වාගේ'' -** විශාල සතුටකදී මෙවැන්නක් කියැවේ.*
5. ''**ඉබිකටුක් බෙහෙතට ඔනෑවීම**'' - අහක දමන දෙයත් ඔන අවස්තා තිබීම.
6. **''ඉත්තෑවාගේ ගෙට කබල්ලෑවා රිංගුවා වාගේ''**
7. **''ඉස්සරින් ආපු කනට වඩා පස්සේ ආපු අඟ ලොකු වුනා වාගේ''**
8. **''ඉහේ ඇම්මට කොට්ටෙ මාරුකලා වාගේ''**
9. **''ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වාගේ''**
10. **''ඉබ්බා අහසින් ගියා වාගේ''**
11. **''ඉබ්බා දියේ දැම්මා වාගේ''**

# උ

1. **''උගුරට හොරා බෙහෙත් බීම'' -** තමන් ව තමන් විසින් ම රවටා ගැනීම
2. **''ඌරන් කැකුණ තලනකොට හබන් කුකුළන්ට ජය මඟුල්''**
3. **''උරුලෑවා ගිය පාර වගේ''**
4. **''උගුරට හොරා බෙහෙත් බොනවා (කනවා) වාගේ''**
5. **''උණහපුළුවාට උගේ පැටියා මැණිකක්ලු''**
6. **''උඩ පැන්නොත් බිම වැටේ''**
7. **''උරුලෑව බළලෙකු කරන්නට බැරි වීම'' -** ඇතැම් වැඩ කල නොහැකි වීම

8. **"ඌරගේ මාළු ඌරගේ ඇගේම තියලා කපනවා වාගේ"**
9. **"උණු හින්දා බොන්නත් බෑ, කිරි හින්දා හලලත් බෑ"**
10. **"උපාසක බළලා වාගේ"**

# එ

1. **"එළිපත්ත උඩ ඉන්න බළලා වාගේ"**

# ඔ

1. **''ඔය බලියට ඔය කට ඇති''**

# ක

1. **"කබලෙන් ළිපට වැටුනා වගේ" -** විපතට පත්වූ අයෙක් ඊටත් වඩා විපතකට පත් වීම
2. **"කුළුවා නටන්නේ දිය රත්වෙන තුරුලු" -** විපතකට පත්වීමට පෙර තාවකාලික සතුටක් ලැබීම
3. **"කළුවා මාරපන ගියා වගේ- අතීතයේ ඉහළ පැළැන්තියේ නිවසක කලුවා නමින් කොල්ලෙක් සිටියේ ය.ඔහු එම නිවසේ වැඩට සිටි කෙනෙකි .ඔහු ගෙදර ස්වාමියාට කීකරුව සිටියේ ය.මේ කලුවා තරමක මෝඩ පහේ කෙනෙකි.නිවසේ ස්වාමියට දිනක් යම් උවමනාවකට කලුවාව මාරපන් යැවීමට උවමනා විය.ඒ සඳහා ඊට පසු දින කලුවා යැවීමට සිතා පෙරදින රාත්‍රියේ කලුවාට මෙසේ කීවේය.**

"කලුවෝ උඹ නිදාගනින් හෙට උඹ රැයින් මාරපන් ගිහින් එන්න ඕන." මේ අසා කලුවා රෑ නිදා ගත්තේය. ඊට පසු දින කලුවා උදෙන්ම නැගිට මාරපන් බලා පිටත් විය.උදේ නැගිටි ස්වාමියා කලුවාව මාරපන් යැවීමට ඔහුව හැමතැනම සෙවුවද කලුවා සිටියේ නැත.බොහෝ වේලාවකට පසු දාඩිය දමමින් කලුවා නිවසට දුවගෙන ආවේ ය. "කලුවෝ උඹ කොහෙද ගියේ?"

"මන් මේ උදේම මාරපන් ගියා" කිය කලුවා පැවසුවේය. මාරපන් යෑමට කී නිසා කලුවා උදේම මාරපන් ගොස් ඇත.එහෙත් හරිහැටි කාරණය නොදැන ගොස් ඇත. යම් කෙනෙක් කුමක් හෝ දෙයක් හරි හැටි නොදැන කරන අවස්ථාවක දී මෙම "කලුවා මාරපන් ගියා වගේ" යන පිරුළ භවිතා වේ ."

1. **"කබලෙන් ළිපට වැටුනා වාගේ"**
2. **"කිඹුලා කන එක ඉවසන්න පුළුවන්" -** කොහිල කටු ඇනෙන එක තමයි ඉවසන්න බැරි.
3. **"කන්න හිතුනම කබරගොයත් තලගොයා වෙනවලු"**
4. **"කොකාට වාරයක් නම් තිත්තයාටත් වාරයක් එනවලු"**
5. **"කොකා බක තපස් රැක්කා වාගේ"**
6. **"කන කොකාගේ සුද පේන්නේ ඉගිලෙනකොටලු"**
7. **"කම්මලේ ඉන්න බල්ලා වාගේ" -** නිතර ම කරදර පැමිණීමෙන් ජීවිතය එයට හුරු වේ.
8. **"කතාව දෝලාවෙන් ගමන පයින්"**
9. **"කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ"**
10. **"කටුස්සාගේ කරේ රත්තරං බැන්දා වාගේ"**
11. **"කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ"**
12. **"කන කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නා වාගේ"**

13. **"කිඹුල් කඳුළු හෙළීම" - බොරුවට අඬනවා**
14. **"කබරයාට තලනවා" - නිෂ්පල දඬුවමක් දීම**
15. **"කිතුලට ගිය එකාටත් කියන්න දේවල් තිබුනලු"**
16. **"කිරි ගහට ඇන්නා වගේ" - හරියටම හරි ගියා**
17. **"කල දුටු කල වළ ඉහගෙන"**

# ග

1. **"ගැරඬි මරා පව් පුරවා ගැනීම" -** අහිංසකයන් ට හිරිහැර කිරීම සුදුසු නොවන බව
2. **"ගමරාළ දිව්‍ය ලෝකේ ගියා වගේ"**
3. **"ගමරාළගේ වංගෙඩිය වාගේ" -** සෑම දෙයකටම පාවිච්චි වන භාණ්ඩයකට මේ නම යෙදේ
4. **"ගඟට කැපුව ඉනි වගේ" -** ප්‍රතිඵල නැති වැඩක් කිරීම
5. **"ගහෙන් වැටුන මිනිහට ගොනා ඇන්නා වාගේ"**
6. **"ගහේ කටු උල් කරන්න ඕන ද"**
7. **"ගල හොඳනම් අඹරන කහ මක් වේද"**
8. **"ගඟෙන් දිය බී මුහුදට ආවඩන්නා වාගේ"**
9. **"ගලෙන් පට්ට ගන්නවා වාගේ"**
10. **"ගලේ පහරපු බළලා වාගේ"**
11. **"ගල් පැලෙන බොරු කීම"**
12. **"ගිනිපෙනෙල්ලෙන් බැට කාපු එකා කණාමැදිරි එළියටත් බයයිලු"**
13. **"ගහ දන්න මිනිහට කොළ කඩා පාන්නා වාගේ"**
14. **"ගිලී මලේ ඇත දත සුද්දෝ -** ඉතා දුර්ලභ මිනිසුන් සිටීම"
15. **"ගිලීමලෙත් ඇත දත සුද්දෝ"**
16. **"ගහපු බෙරේකුත් නෑ බෙරේ පලුවකුත් නෑ"**

# ජ

1. **"ජාඩියට මූඩිය වගේ"** - ඉතා තදින් ගැලපීම

# ත

1. **"තට්ටු කරන්නාට දොර ඇරේ"**

# ද

1. **"දිලිසෙන සියල්ල රත්තරන් නොවේ"-** බාහිර ඔපයට නොරැවටිය යුතුයිදී"
2. **"කිරට බළලුත් සාක්කිලු"-** කවුරුත් වාසි ඇත පැත්ත ට එකතු වේ"
3. **"දිළිසෙන සියල්ල රත්තරං නොවේ"**
4. **"දාහට අරං සීයට දුන්නා වාගේ"**
5. **"දත් නැති දා උක් දඬු ගිනි තපින්නද"**
6. **''දියකාවගේ පිටෙ ලුනු හැංගුවා වගෙ''**

7. "**දේසේ හැටියට වාසේ**"

# න

1. **"නරියා හුවෙන් හඳුනා ගත හැකිය" -** කපටියා කතාවෙන් හඳුනා ගත හැකිය
2. **"නයාට අඳුකොළ වගෙයි" -** දැකීමට කොහෙත්ම අකමැති වීම
3. **"නටන්නට බැරි මිනිහා පොලව ඇදයි කීම" -** අදක්ෂයා තම බැරිකම වහගැනීමට වෙන දෙයක වරදක් කීම
4. **"නටපු නැටුමකුත් නෑ, බෙරේ පළුවකුත් නෑ"**
5. **"නංගි පෙන්නලා අක්කා දෙනවා වාගේ"**
6. **"නිදා සිටින යෝදයෙකු වාගේ"**
7. " **නොදන්න යකාට වඩා දන්න යකා හොදයි**"

# ප

1. **"පනින්නට පෙර සිතා බලනු" -** යමක් කිරීමට පෙර කල්පනා කර බැලිය යුතුයි
2. **"පුහුල් හොරා කරෙන් දැනේ" -** බාහිර ඉරියවු වලින් වරදකරු සොයා ගැනීම
3. **"පවට පින් දෙන්න බෑ" -** බලහත්කාරයෙන් කෙනෙකුට යහපතක් කල නොහැකිය
4. **"පිරුණු කලේ දිය නොසැලේ" -** උගතුන් නිහතමානී වේ.
5. **"පුවක් ගහෙන් බහින්නා වගේ" -** යම්දෙයක් ඉතා පහසුවෙන් සහ ඉක්මනින් කිරීම
6. **"පනින රිලවුන්ට ඉනිමං බදින්නා වාගේ"**
7. **"පරංගියා කෝට්ටේ ගියා වාගේ"**
8. **"පුහුල් හොරා කරෙන් දැනේ"**
9. **"පල නොකියා පලා බෙදන්නා වාගේ"**
10. **"පෙරහැරේ යන අලි කොට අදින්නේ නැතුවා වාගේ"**
11. **"පෙරලෙන ගලේ පාසි නොබැදේ"**
12. **''පාලු ගෙහි වලන් බිදුනා වගේ'' -**

# බ

1. **"බීරි අලියා ට වීනා වයනවා වගේ" -** අවවාද නොඅසන්නෙකුට අවවාද කිරීම
2. **"බුරන බල්ලා හපා නොකයි"**
3. **"බල්ලට ඇති වැඩකුත් නෑ හිමින් ගමනකුත් නෑ"**
4. **"බල්ලා පිඳුරු කන්නෙත් නෑ, කන ගොනාට දෙන්නෙත් නෑ"**
5. **"බල්ලෙක් බිරුවට කන්දක් පාත් වේද"**
6. **"බළලුන් ලවා කොස් ඇට බාවනවා වාගේ"**
7. **"බල්ලගේ වැඩේ බූරුවා කරන්න ගියා වාගේ''**
8. **''බත් නැති දා කොස් තිත්තලු''**

# ම

1. **"මුහුද හත් ගව්වක් තියා අමුඩ ගහනවා වාගේ"**
2. **"මරණ තුනක් ඇති මිනිහෙක් පැණි කෑවා වාගේ"**
3. **"මඩ සෝදා ගත් කළ ගොවියා රජකමටත් සුදුසුය"**
4. **''මඩේ සිටවූ ඉන්න වගේ'' -** ස්ථිර බවක් නොමැති

## ය

1. **"යන්නෙ කොහේද මල්ලෙ පොල් කීවාලු"**
2. **"යුද්දෙට නැති කඩුව කොස් කොටන්නද"**

## ර

1. **"රයිගමයයි, ගම්පලයයි වාගේ"**
2. **''රෑ වැටුන වලේ දවල් වැටීම"**

## ල

1. **"ලූලා නැති වලට කනයා පණ්ඩිතයා"**
2. **"ලැජ්ජා නැතිකම මහමුදලි කමටත් වඩා ලොකුයිලු"**
3. **''ලෙඩ කපුටෝ වැල කනවා වාගෙයි''**

## ව

1. **"වක්කඩේ හකුරු හැංගුවා වාගේ" -** යම් දෙයක් ප්‍රවේසම් කිරීමට ඊට නොගැළපෙන ස්ථානයක සැඟවීමෙන් එය විනාශ වීම
2. **"වත්ත බද්දට දී ඇස්සට දත නියවනවා වාගේ"**
3. **"වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසම් ඒ අමාරුව"**
4. **"වඩුවගේ ගෙදර පුටුව නෑ වාගේ"**
5. **"වන්සේ කබල් ගාන්නා වාගේ"**
6. **"වෙහෙර ගිලපු එවුන්ට අග්ගලා කජ්ජක්ද"**
7. **"වඳින්න ගිය දේවාලේ ඉහේ කඩා වැටුනා වාගේ"**
8. **"විෂ්ණු දෙයියෝ බටකොළ කෑවා වාගේ"**

## ස

1. **"සොල්ලම ලෙල්ලම වෙනවාලු"**

## හ

1. **"හිත ඇත්නම් පත කුඩාද"**
2. **"හිඟන්නාගේ පාත්තරේට හෙනහුරා වැටුනා වාගේ"**
3. **"හිඟන්නාගේ තුවාලය වාගේ"**

# ප්‍රස්ථා පිරුළු 50

1. අශ්වයාට අං අවා වගේ :- පමණට වඩා උඩගු වීම
2. අගේ ඉදන් කණ කනවා වගේ :- ළඟින් ඇසුරු කරමින් සතුරුකම් කිරීම
3. අනින ගොනා වැඩට හොඳයි :- සැරවැර තිබුණ ද කාර්යය හොඳින් කිරීම
4. අතු කඩා මොර කන්නා වගේ :- විනාශ කරමින් ප්‍රයෝජන ගැනීම
5. අත්තික්කා ගහේ මල් පිපුණා වගේ :- පුදුම සහගත යමක් සිදු වීම
6. ආටා නාටිය කියවනවා වගේ :- මහා ගෝෂාවක් සිදු කිරීම
7. ආඳාගේ පිට වගේ :- ස්ථිර ප්‍රතිපත්තියක් නොමැති වීම
8. ආතාට අටු කොස් දුන්නා වගේ :- ප්‍රයෝජනයට ගත නොහැකි දෙයක් තෑගි කිරීම
9. ඇගෙන් ඇටයක් ගියා වගේ :- බොහෝ අකමැත්තෙන් යමක් දීම
10. ඇඟිලි පහම එක වගේ ද :- එක හා සමාන නොවීම
11. ඉබ්බා අහසින් ගියා වගේ :- තමන්ට නොගැලපෙන යමක් කර විනාශ වීම
12. ඉහිරුණු කිරට අඩන්න එපා :- සිදු වූ දෙය පිලිබද දුක් වෙන්න එපා
13. උඩින් මිතුරු යටින් සතුරු :-උඩින් හොඳ මුහුණ පෙන්නා යටින් සතුරුකම් කිරීම
14. එක මල්ලේ ලුණු කාලා වගේ :- එක සමාන පිරිසක් පිළිබද කීම
15. එළිපත්ත උඩ ඉන්න බල්ලා වගේ :- නිශ්චිත තීරණය නොගෙන සිටීම
16. එකට කෑවත් බොක්ක වෙනස් :- එකට වාසය කලද වාසියේ දී වෙනස් වීම
17. කළු නික සොයන්නා වගේ :- ඉතා අමාරු දෙයක් සෙවීම
18. කළුවා මාරපන් ගියා වගේ:- විමසීමෙන් තොර ව කටයුතු කිරීම
19. කවට කමින් ඇස් රතුවෙනවා :- සෙල්ලම ලෙල්ල ම වීම
20. කිඹුලා කිරි මැටි ගිලින්නා වගේ :- කෑම වල රස පිළිබද නොසිතා ගිල දැමීම
21. කිරි ගහට ඇන්නා වගේ :- හරියට ම හරි ගිය දෙයක්
22. කිරි මුහුදට හඳ පෑව්වා වගේ :- වඩාත් සතුටු වීම
23. කිරියි පැණියි වගේ :- ඉතා හොඳින් ගැළපීම
24. කුරුල්ලන්ට වැට බන්දා වගේ :- අසාර්ථක ලෙස වැඩ කිරීම

26. බක තපස රකනනා එගෙ :- බොරැ සලයක රැකම
27. ගිය ලූලා මහ එකාලු :- නැති වූ දෙයක් අගය කිරීමේ දී යෙදේ
28. ගුරුන්ටත් අකුරු වරදී :- ඉතා දක්ෂයින්ට ද වැඩ වරදී
29. ගෝනි නැති ව කරෙන් යනවා වගේ :- බොරුවෙන් චාටුවෙන් රවටා ගැනීම
30. තට්ටු කරන්නාට දොර ඇරේ :- උත්සහ වන්තයා ජය ගනී
31. දවල් තරු පෙනිලා වගේ :- බලවත් වරදක් මුලාවක් සිදුවීම
32. දාහට අරන් සියයට දුන්නා වගේ :- පාඩු ගෙන දෙන වෙළෙඳාම
33. දිමි කූඩුව ඇවිස්සුවා වගේ :- බලවත් වූ කැලඹීමක් ඇති කිරීම
34. දිය යටින් ගින්දර ගිනියනවා වගේ :- මිත්‍ර වී සිට යටි උගුල් ඇටවීම
35. දී කිරට බළලුත් සාක්කිලු :- වාසි ඇති තැනට කවුරුත් හිතවත් වීම
36. දේසේ හැටියට වාසේ :- තැනට සුදුසු ලෙස වැඩ කටයුතු සිදු කිරීම
37. පිස්සිගේ පලා මල්ල වගේ :- කිසි පිළිවෙළට නොමැති වීම
38. යොත් මැරිල්ලක් :- අසරණාධාර ගනුදෙනුවක් කිරීම
39. හොදට නොහොදට දෙකට කටම ය :- හෙදට නරකට දෙකට ම කට මුල් වීම
40. හොර බල්ලට පොල් බෑයෙන් ගැහුවා වගේ :- මෝඩ දඩුවමක් දීම
41. හොරාගේ අම්මාගෙන් පේන අහනවා වගේ :- ඇත්ත සගවා බොරු කීම
42. හොස්ස ළගින් මැස්සට වත් යන්න බෑ වගේ :- සුළු දේකට පවා කේන්ති යාම
43. ළගින් ගියොත් ඇහැක් නෑ :- කපටි පුද්ගලයින්
44. ළිදක් කපා උල්පත් දැක්කා වගේ :- මහන්සියෙන් ප්‍රථිපල ලැබීම
45. ලිදේ සිටින මැඩියා වගේ :- සුළු දනුමක් ඇති තැනැත්තා
46. අටුව කඩා පුටුව හැදුවා වගේ :- වටිනා දෙය විනාශ කිරීම
47. ආඩි හත් දෙනාගේ කැද හැලිය වගේ:-එක සමාන කපටි පුද්ගලයින් වාසය කිරීම
48. පරංගියා කෝට්ටේ ගියා වගේ :- කෙටි මාර්ගයක් තිබිය දී දුර මාර්ගයකින් යෑම
49. පුන්සදෙත් කැළලක් නැද්ද :- මෙලොව වරදක් නැති කෙනෙක් නැත
50. ජාඩියට මූඩිය වගේ :- හොදින් ගැලපෙන අය

# ප්‍රස්තාව පිරුළු

1. **වක්කඩේ හකුරු හැංගුවා වගේ** - අනාරක්ෂිත තැනක යමක් පරිස්සමට තැබීම
2. **තෙලෙන් බැද්දත් කොබෙයියා - කිරෙන් බැද්දත් කොබෙයියා** - ප්‍රදේශය වෙනස් වුවත්, කාලය වෙනස් වුවත් පුද්ගලයන්ගේ සහජ ගති ගුණ, පුරුදු වෙනස් වන්නේ නැත.
3. **වඳින්න ගිය දේවාලේ හිසේ කඩා වැටුණා වගේ** - පිහිටක්, යහපතක් බලාපොරොත්තුවෙන් ගියත් විපතක් සිදුවීම.
4. **ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න ඕනෙ** - තමන්ගෙ තරම දැනගෙන කටයුතු කළ යුතුයි.
5. **අනුන්ගෙ පහනින් එළිය බැලීම** - පිටස්තර අයගෙන් සියල්ල බලාපොරොත්තු වීම.
6. **විද්දෙ හාවට වැදුණෙ පඳුරට** - යමකින් බලාපොරොත්තු වූ ප්‍රතිඵලය නොලැබීම.
7. **පැණි වරකා ගහටත් හෙණ වදිනවාලු** - යහපත් දෙයකට වුවද හානි පැමිණේ.
8. **පැණි හැළියෙ වැටුණ ඇඹලයා වගේ** - යමකට ඉතා ආසාවෙන් ඇලී ගැලී සිටීම.
9. **නයාට අඳුකොළ වගෙයි** - තදින් යම් දෙයකට වෛර කිරීම.
10. **කල දුටු කල වළ ඉහ ගන්නා සේ** - අවස්ථාවෙන් ලාභ ප්‍රයෝජන ගැනීම.
11. **දත් නැති දා උක් දඬු ගිනි තපින්නද** - අවශ්‍ය වෙලාවට නැති නම් පසුව එලක් නොවේ.
12. **ගහට ඉනි කැපුවා වගෙයි** - මහන්සි වී කරන වැඩෙන් ප්‍රතිඵලයක් අත් නොවීම.
13. **ගිරයට අහුවුණ පුවක් ගෙඩිය වගේ** - කිසිම ගැලවීමක්, නිදහසක් නැති.
14. **ගඟෙන් දිය බී මුහුදට ආවඩනවා** - උපකාර කළ අය අමතක කර වෙනත් අයට ප්‍රශංසා කිරීම.
15. **ඇඟෙන් ඇටයක් ගියා වගේ** - බොහෝ අකමැත්තෙන් යමක් දීම.
16. **කටින් බතල හිටවන්නා වගේ** - යමක් කතාවට පමණක් සීමා කිරීම.
17. **උඩින් මිතුරු යටින් කතුරු** - හිතවත්කම පෙන්වමින් උගුල් ඇටවීම.
18. **දිය මතුපිට ඇඳි ඉරක් වගෙයි** - යමක් ඉතා ඉක්මනින් අමතක වී යෑම.
19. **පරංගියා කෝට්ටේ ගියා වගේ** - යෑමට කෙටි මාර්ගයක් තිබිය දී දීර්ඝ ගමනකින් අදාළ තැනට ළඟා වීම.
20. **කටුස්සගෙ කරේ රත්තරන් බැන්දා වගේ** - නුසුදුසු පුද්ගලයින්ට තනතුරු දීම.
21. **දුවන මුවන් දැක නොදමව් නෙළු පලා** - විශාල වාසි තකා තමන් ළඟ ඇති දේ ඉවත දැමීම.
22. **යුද්දෙට නැති කඩුව කොස් කොටන්නද**- උවමනා වේලාවට නැති දෙයින් පසුව එලක් නොවීම.
23. **ගහෙන් වැටුණ මිනිහාට ගොනා ඇන්නා වගේ**- අමාරුවෙන්, කරදරයකින් බේරුණ විට ඊටත් වඩා වැඩි කරදරයකට මුහුණ දෙන්නට සිදුවීම.
24. **දිලිසෙන සියල්ල රන් නොවේ** - මතුපිට ඔපයට නොරැවටෙන්න.
25. **ගහ දන්න අයට කොළ කඩා පාන්නා සේ** - සත්‍ය තොරතුරු දන්නා අයට ඇත්ත වසන් කිරීම.
26. **ගහට ගහක් මොරටුවෙදී හමුවෙනවාලු** - කවදා හෝ යළි මුණගැහෙන බව.
27. **ගිලීමලෙත් ඇත දත සුද්දෝ** - නරක ගති ගුණ ඇති අය ළඟද හොඳ අය ඇත.

28. මුහුද හත් ගව්වක් තිබියදී අමුඩ ගැසුවා වගේ - යම් දෙයකට ප්‍රමාණය ඉක්මවා සූදානම් වීම.
29. ආචාරියා රවටා කැත්ත හැදුවා වගේ - අන් අය රවටන්නට ගොස් තමන්ම රැවටීම.
30. මිටිකිරි විසිකර දියකිරි ගත්තා වගේ - හොඳ දේ ඉවත දමා නරක දේ ප්‍රයෝජනයට ගැනීම.
31. ගින්නක් නොමැතිව දුමක් නොනගී - හැම දෙයකටම හේතුවක් ඇත.
32. නරියා පඹ ගාලෙ පැටලුනා වගෙයි - විසඳන්නට නොහැකි අවුලකට පත්වීම.
33. උගුරට හොරා බේත් කනවා වගේ - යන්තම් ගැලවීමට වැඩ කිරීම.
34. බත් ඇති දාට කොස් තිත්තලු - වටිනාකමින් වැඩි දේවල් ලැබෙන විට සුළු දේවල් අමතක වීම.
35. ඉදිකටු තුඩේ තපස් රැක්කා වගෙයි - ඉටුකළ නොහැකි දේකට වෙහෙසීම.

## යුගල පද

### සමානාර්ථ පද යුගලයක් යෙදීම

| | | |
|---|---|---|
| මිල මුදල් | සමිති සමාගම් | නැණ නුවණ |
| වැහි වරුසා | දුගී දුප්පත් | පදවි තානාන්තර |
| බණ දහම් | වෙහෙර විහාර | ශිල්ප සාස්තරේ |
| යාන වාහන | කෙළි සෙල්ලම් | රැකී රක්ෂා |

### විරුද්ධාර්ථ පද යුගලයක් යෙදීම

| | | |
|---|---|---|
| දුක සැප | උගත් නූගත් | ගුණ දොස් |
| හොඳ නරක | ඇති නැති | එදා මෙදා |
| ඈත මෑත | බාල මහලු | එතෙර මෙතෙර |
| පින් පව් | අඩු වැඩි | අග මුල |

### එක් පදයක අර්ථ සහිත අනෙක් පදයේ අර්ථ රහිත පද යුගලයක් යෙදීම

| | | |
|---|---|---|
| බඩු මුට්ටු | මුදල් හදල් | උදව් පදව් |
| කුලී මලී | පඩි නඩි | තරහ මරහ |
| ගමන් බිමන් | බාර හාර | ඉඩම් කඩම් |
| ළමයි බමයි | කුල මල | තොවිල් පවිල් |

### අර්ථ රහිත පද යුගලයක් යෙදීම (එහෙත් එයින් යම් අර්ථයක් ඉස්මතු වේ)

| | | |
|---|---|---|
| ලට පට | තක්කු මුක්කු | දනි පනි |
| ජර මර | ඕප දූප | තොර තෝංචි |
| ආන පාන | අනං මනං | අඩුම කුඩුම |
| වං හුං | ලවක් දෙවක් | ලට්ට ලොට්ට |

### අර්ථය අතින් තරමක් සමීප පද යුගලයක් යෙදීම

| | | |
|---|---|---|
| ඇට කටු | පොත පත | ළඟ පාත |
| වතු පිටි | හැළි වළං | කයි කතන්දර |
| ගේ දොර | නිති රීති | කොට්ට මෙට්ට |
| දුගී මගී | ලියුම් කියුම් | හොර බොරු |

### එකිනෙකට අසමාන පූර්ව ක්‍රියා පද යුගලයක් යෙදීම

| | | |
|---|---|---|
| සිනා බලා | ලියා කියා | නටා ගයා |
| දුව පැන | හදා වඩා | උයා පියා |
| බලා කියා | කර කියා | ගයා වයා |
| කවා පොවා | තළා පෙළා | සොයා බලා |